# නිර්මහාපරිමාණකරණය (Demassification) සහ මාධ්‍ය ආධිපත්‍යය කෙරෙහි එහි බලපෑම.

ජනදාස පීරිස්.
22 ඒ, මල්ලිකා පටුමග, කොළඹ 06.

## ABSTRACT

අද ලෝකයේ එකවිට සිදුවෙමින් පවත්නා අපූරු ප්‍රවණතා දෙකකි. එකක් ගෝලීයකරණයයි. අනෙක සන්නිවේදන විප්ලවයයි. මෙයටම සමගාමීව ලෝකය ඥාණ යුගයට (Knowledge Age) එළඹෙමින් සිටී. මෙය විද්‍යා හා තාක්ෂණික විප්ලවයේ නියත ප්‍රතිඵලයකි. කෘෂිකාර්මික හා කාර්මික යුගවලදී පැවැති නිෂ්පාදන සාධක හා නිෂ්පාදන රටාව දැන් වෙනස්වී ඇත. මුලින් මධ්‍යගතව හා එකම ප්‍රමිතියකට අනුව එකම අච්චුවේ තොග වශයෙන් සහ මහා පරිමාණයෙන් සිදුකෙරුණු භාණ්ඩ නිෂ්පාදනය පසු කලෙක විවිධාංගිකරණයට හා විශේෂීකරණයට භාජනය විය. දැන් බිහිවෙමින් ඇත්තේ එදා මෙන් මහා පරිමාණය පදනම් කරගත් නිෂ්පාදන රටාවක් නොව පුද්ගල කේන්ද්‍රිය අවශ්‍යතා පිරිමසාලන නිෂ්පාදන රටාවකි. මහාපරිමාණ පොදු බවින් මිදුණාවූ යන තේරුම ගෙන දෙන (Demassification) යන ඉංග්‍රීසි පදය භාවිතාවන්නේ මෙම පසුබිම තුළය.

මෙම පරිවර්තනය සමාජයේ බොහෝ ක්‍ෂෙත්‍රවලට මෙන්ම ජන සංනිවේදන ක්‍ෂෙත්‍රයට ද බලපා තිබේ. උදාහරණයක් වශයෙන් දැක්වුවහොත් රූපවාහිනී ප්‍රවෘත්ති, විශේෂාංග, නාට්‍ය හෝ චිත්‍රපට ආදිය තෝරා බේරාගෙන නැරඹීමේ ප්‍රවණතාවක් සමාජයේ දක්නට ලැබේ. තමන් කැමති දේ පමණක් නැරඹීමට, ශ්‍රවණය කිරීමට හෝ කියවීමට ජනතාව පෙළඹෙන තත්ත්වයක් උදාවෙමින් තිබේ. මගේ පර්යේෂණයට පාදක වී ඇත්තේ වඩවඩාත් පුද්ගල කේන්ද්‍රිය වන සහ මහා පරිමාණ පොදු බවින් මිදුණාවූ නිෂ්පාදන රටාව ජනසංනිවේදනයට බලපාන්නේ කෙසේද යන්නයි.

අනාගත ජනසංනිවේදන ක්‍රියාවලියේ දී මාධ්‍යයේ පොදු පරිභෝජනයක් හැතිනම් මහා පරිමාණ ක්‍රියාවලියක් වෙනුවට එය පුද්ගල කේන්ද්‍රිය ක්‍රියාවලියක් බවට පත් වෙමින් තිබේ. මෙම නව මාධ්‍ය අනුව පණිවුඩ පද්ධතිය පාලනය කරන්නේ යවන්නා නොව එය ලබා ගන්නා තැනැත්තාය. බහුවිධ වැඩ සටහන් සහිත පුළුල් රූපවාහිනී ආයතන වෙනුවට ඒ ඒ විෂයන්ට වෙන්වුනු වෙන වෙනම රූපවාහිනී නාලිකා ජනප්‍රිය වී ඇත්තේ ද මේ නිසාය.

අදටත් මාධ්‍යකරුවාගේ එක් කාර්යභාරයක් වී ඇත්තේ ජන සමාජය තුළ කිසියම් ජන මතයක් හැඩගැස්වීමට උත්සාහ දැරීමයි. නැතිනම් තමන්ට අවශ්‍ය පරිදි ජනමතය හැසිරවීමයි. පාරිභෝගිකයාගේ පුද්ගල කේන්ද්‍රිය අවශ්‍යතා සපුරාලීමට මාධ්‍ය ආයතන ඉදිරියේදී ක්‍රියා කිරීම නිසාම මාධ්‍යට අද හිමි වී ඇති අධිපතිවාදී ස්වරූපය බිඳී යන බව මගේ පර්යේෂණයෙන් හෙලිවෙමින් තිබෙන නිගමනයයි.

සංනිවේදන ක්ෂේත්‍රයේ ඇතිවන මෙම විප්ලවීය වෙනස්කම් නිසාම සමස්ත ජන මාධ්‍ය යාන්ත්‍රනයම වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ස්වභාවයකට පරිවර්තනය වන්නේය. වෙනත් වචනවලින් කියතොත් ජන මතය හැසිරවීමට මාධ්‍ය දැවැන්තයන් කිහිප දෙනෙකුට දැනට හිමිවී ඇති අධිපතිවාදී බලය දුර්වල වී යන්නේය.

අවසාන විග්‍රහයේදී ගෝලීයකරණය හේතුකොට ගෙන රාජ්‍ය යන්ත්‍රය වඩාත් ලිහිල් වන්නේ යම් සේද ඥාණ යුගයේදී බිහිවන පුද්ගල කේන්ද්‍රිය නිර්මහාපරිමාණකරණයට ලක්වන නව නිෂ්පාදන රටාවේ බලපෑම හේතුකොට ගෙන මාධ්‍යද වඩාත් ලිහිල්කරණයට ලක් වී පුද්ගලයා ඉස්මතු වන්නේය. එක් වචනයකින් සඳහන් කළහොත්, මේ සියල්ලේ අවසාන ප්‍රතිඵලය නිදහසයි. කලකදී රාජ්‍ය වියළී යන්නේ යයි කාල්මාක්ස් ප්‍රකාශ කළේය. ගෝලීයකරණය හමුවේ එය දැන් සිදු වෙමින් පවතී. බිහිවෙමින් පවත්නා පුද්ගල කේන්ද්‍රිය මාධ්‍ය රටාව හේතුවෙන් අධිපතිවාදී මාධ්‍ය යාන්ත්‍රණය ද වියළී යන බව මගේ පර්යේෂණයෙන් ඔප්පු වෙමින් තිබේ.